**වැල්වැටිතුරේ නගර සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**
**----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 26 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 30 දින විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ඔක්තෝබර් 31 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට වැල්වැටිතුරේ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | නගර සභා මූල්‍ය රීති මාලාවේ III පරිච්ඡේදයේ 54 (3) වගන්තිය | රු.4,538,640 ක් වටිනා හිඟ වරිපනම් බදු ගෙවීම පැහැර හැරී පුද්ගලයන්ට සභාපතිවරයා විසින් වරෙන්තු නිකුත් කර නොතිබුණි. | නියමිත නගර සභා මූල්‍ය රීතීන්වලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | ඉදිරි කාලයේදී මේ පිළිබඳ කටයුතු කිරීමට උත්සාහ කරනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 571 | රු.63,877 ක් වටිනා කොන්ත්‍රාත්කරුවන්ට ආපසු ගෙවිය යුතු ඇපමුදල් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | නියමිත නගර සභා මූල්‍ය රීතීන්වලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | ඉතිරි මුදල් රු.63,877 ක් ගෙවිය යුතුව තිබුණි. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන උතුරු පළාත් මූල්‍ය චක්‍රලේඛය | සභාවේ වාහන 02 කට ඉන්ධන පරිභෝජන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | නියමිත නගර සභා මූල්‍ය රීතීන්වලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | වාහන හානියට පත් වී තිබූ හෙයින් ඉන්ධන පරිභෝජන පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 5,733,352 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 14,127,614 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,406,500 | - | 1,727,713 | 4,538,640 | 790,000 | - | 764,485 | 3,747,336 |
| (ii) | කුලී | 2,873,850 | - | 3,700,781 | 47,000 | 5,682,000 | - | 3,570,082 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 734,500 | - | 716,355 | - | 738,500 | - | 839,645 | - |
| (iv) | වෙනත් ආදායම් | 50,362,500 | - | 47,264,939 | 11,617,089 | 47,380,00 | - | 50,115,652 | - |
| | එකතුව | 56,377,350 | - | 53,765,238 | 16,202,729 | 54,591,000 | - | 55,289,864 | 3,747,336 |

* බිල් කළ ආදායම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2017 වර්ෂයේ රැස්කළ ආදායම රු.55,289,864 ක් වුවත්, 2018 වර්ෂයේ රැස්කළ ආදායම රු.53,765,238 ක් වීමෙන් 2017 වර්ෂය සමඟ සැසඳීමේදී 2018 වර්ෂයේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය රු.1,524,626 කින් අඩු වී තිබූ බව නිරීක්ෂණය විය. | බිල් කළ ආදායම් තහවුරු කළ යුතු වේ. | 2018 වර්ෂයේ රැස්කළ මුද්දර ගාස්තු ලැබීමේ දී ආදායම් සමඟ එකතු කරනු ලැබේ. |
| (ආ) සභාව විසින් පසුගිය වර්ෂ 05 ක් පුරා බිල් නොකිරීමෙන් අදාළ ආදායම් පිළිබඳ හිඟහිටි ප්‍රමාණය තහවුරු කරගත නොහැකි වී තිබුණි. | සභාවේ ආදායම් බිල් කළ යුතු වේ. | ඉදිරි වර්ෂවල ඒ සඳහා ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

**2.2.3 වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ හිඟ දේපල බදු රු.4,538,640 ක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | හිඟ හිටි මුදල් නියමිත කාලයේදී අයකර ගත යුතු වේ. | ඉතිරි මුදල් රු.3,738,097 ක් අයකර ගත යුතුව පැවතුණි. |

**2.2.4 උසාවි දඩ මුදල් මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ මුදල් රු.4,436,614 ක් සහ මුද්දර ගාස්තු රු.2,309,206 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ මුදල් ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. | ලැබිය යුතු දඩ ගාස්තු සියල්ල භාණ්ඩාගාරයට ලැබීමෙන් පසුව සභාවලට එම මුදල් ප්‍රේෂණය කරනු ලැබේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

මහනගර සභා ආඥා පනතේ 4 වැනි වගන්තිය අනුව, මහජන සෞඛ්‍යය, මහජන උපයෝගීතා සේවාවන් සහ පොදු මංමාවත් සහ මහජන සුවය පහසුකම් සහ සුභසාධනය ආදී සභාවෙන් ඉටුකළ යුතුව තිබූ කාර්යයන් ඉටුකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

#### (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නගර සභා ආඥා පනතේ 157 වගන්තිය ප්‍රකාරව 10 සිට 15 දක්වා වූ මූලික කරුණු පිළිබඳව අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කළ යුතු වුවත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා මූලික කරුණු 05 ක් සඳහා පමණක් සකස් කර නොතිබුණි. | අදාළ ආඥා පනත අනුව කටයුතු සිදු කළ යුතු වේ. | 10-15 දක්වා උප රීති සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ. |

#### (ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පනවා තිබූ උප රීතීන් ප්‍රකාරව සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් 10 ක් සම්බන්ධයෙන් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | සභාව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වේ. | ඉදිරි කාලයේදී කටයුතු කරනු ලැබේ. |

#### (ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කසළ ද්‍රව්‍ය බැහැර කිරීම සඳහා නියමිත ස්ථානයක් තෝරාගෙන කසළ ද්‍රව්‍ය වෙන් නොකර එකට ගොඩ ගසා පුළුස්සනු ලැබේ. මේ නිසා පරිසර දූෂණය වීමේ තත්ත්වයක් දක්නට ලැබුණි. | ඝන අපද්‍රව්‍ය විධිමත් ආකාරයෙන් වෙන්කර එකතු කිරීම තහවුරු කළ යුතු වේ. | පරිසර දූෂණය වලකාලීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

(ඇ) පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා තෝරාගෙන තිබූ ප්‍රදේශයේ මැසි මදුරුවන් බෝවීම මර්ධනය සඳහා මැසි තෙල් ඉසීම සහ දුර්ගන්ධය වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සන අපද්‍රව්‍ය බැහැර කිරීම් පිළිබඳ ක්‍රියාමාර්ග සිදු කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයන් ගනිමින් පවතී. |

(ඉ) තිරසාර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 අප්‍රේල් 23 දිනැති වි.ලේ.පො/2018/16 දරන චක්‍රලේඛය ප්‍රකාරව තිරසාර සංවර්ධන ඉලක්කය ලඟා කරගැනීම සඳහා සභාව විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව ක්‍රියාමාර්ග ගත යුතු වේ. | මේ සම්බන්ධයෙන් වැඩසටහන් ක්‍රියාත්මක වෙමින් පවතී. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | රු.62,220,310 ක් වටිනා ස්ථාවර තැන්පතුව නගර සංවර්ධන අරමුණු සඳහා උපයෝජනය නොකර පොලී ආදායම් ඉපැයීමේ අරමුණින් බැංකුවේ තැන්පත් කර තිබුණි. | ස්ථාවර තැන්පතු ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සඳහා උපයෝජනය කළ යුතු වේ. | මේ පිළිබඳව ඉදිරි කාලයේදී කටයුතු කරනු ලැබේ. |
| (ආ) | සභාව සතු සුසාන භූමි 05 කින් ඒ සඳහා බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | සභාව එහි ආදායම් නියමිත අයුරින් අයකර ගත යුතු වේ. | ගාස්තු අයකර ගැනීම සඳහා කටයුතු කරනු ලැබේ. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් මානව සම්පත් විධිමත්ව බඳවා ගැනීම සහ යෙදවීම සිදුකර නොතිබූ බැව් නිරීක්‍ෂණය වූයෙන්, එවැනි මානව සම්පත් 10 ක් විසින් නිමකළයුතු කාර්යයන් ප්‍රමාදවී තිබුණි. | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කෙරේ. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ රු.253,919 ක් වටිනා ආදි කෝවිලඩි මාර්ග කර්මාන්තය සඳහා මුදල්, සභාව විසින් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදල් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | අදාළ කටයුතු කෙරෙමින් පවතී. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.1,035,000 ක් වටිනා වාහන 02 ක් සභාවේ නමට අයිතිය මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. | සභාවේ නමට අයිතිය මාරු කිරීමට කටයුතු කළ යුතු වේ. | පරිත්‍යාග වශයෙන් ලැබූ වාහනයේ ලියාපදිංචි පොත නොමැති වීමෙන් අයිතිය මාරු කිරීමේ ප්‍රමාදයන් සිදු වී තිබේ. |

**3.5.2 නිෂ්කාර්ය වත්කම්**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මහජනතාවට අගනා සහ ප්‍රයෝජනවත් සේවාවක් ලබා දීම සඳහා එක් මහජන උද්‍යානයක් ඉදිකිරීම සඳහා 2013 ජුනි 28 | සභාව විසින් තම අරමුදල් ඵලදායී ආකාරයෙන් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වේ. | කාර්යයන් සම්පූර්ණයෙන් අවසන් වූ පසුව මහජන භාවිතය සඳහා විවෘත කෙරේ. |

| | | | |
|---|---|---|---|
| | දිනැති සහ තීරණය පරිදි බදු පදනමට ලබාගත් ඉඩමේ මේ දක්වා උද්‍යානය ඉදිකර නොතිබූ අතර සභාව විසින් රු.298,800 ක් බදු ගාස්තු ලෙස ගෙවා තිබුණි. | | |
| (ආ) | නව වෙළඳපොල ගොඩනැගිලි සංකීර්ණයේ A Block හි කඩ කාමර 11 ක් සහ විවෘත මණ්ඩපය කුලියට ලබා දී නොතිබූ නිසා නගර සභාවට ආදායම් අහිමි වී තිබුණි. | සභාව එහි වත්කම් උපයෝගී කරමින් ඵලදායී අන්දමින් ආදායම් ඉපැයීමට කටයුතු කළ යුතු වේ. | ලංසු කැඳවා තිබූ නමුත් කිසිවකු ඉල්ලුම් කර නොතිබුණි. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ සේවක වැටුප්, ගමන් වියදම්, මූලධන වත්කම් අලුත්වැඩියා සහ නඩත්තුව, විශ්‍රාම වැටුප්, විශ්‍රාම පාරිතෝෂික වැනි වියදම් හිතකරවත් භාණ්ඩ හා අවශ්‍යතා, සහනාධාර, උපකාර මුදල්, පැටවුම් හා ගොඩබෑම් සන්නිවේදන සම්බන්ධතා සේවාවන් සහ වෙනත් වියදම් අහිතකරවත් පැවතුණි. | අයවැය ඵලදායී පාලන කාරකයන්ට අනුකූලව සැලසුම් කර සකස් කළ යුතු වේ. | අයවැය හා තථ්‍ය අතර වෙනස්කම් නිවැරදි කිරීමට ඉදිරි කාලයේදී ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

**4.2** **නිරවුල් නොකළ නිරීක්ෂණ සහ පිළිතුරු නොලත් විගණන විමසුම්**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නගර සභාව සම්බන්ධයෙන් 2016 ඔක්තෝබර් 24 දින පළාත් රජයේ ගිණුම් කාරක සභාව විසින් විමර්ශනය කළ විගණකාධිපතිවරයාගේ 2012, 2013 වර්ෂ සඳහා විගණන වාර්තා පිළිබඳ නිරීක්ෂණයන් සම්බන්ධයෙන් මේ දක්වා පියවර ගෙන නොතිබුණි. | පළාත් ගිණුම් කාරක සභාව විසින් විමර්ශනය කළ 2012 සහ 2013 වර්ෂවල විගණන වාර්තා සම්බන්ධයෙන් වූ නිරීක්ෂණවලට අනුව කටයුතු කළ යුතු වේ. | අදාළ මුදල් අයකර ගැනීමට උපදෙස් ලබා ගැනේ. |